**ශ්‍රී ලංකා මහ බැංකුව - 2020**

-----------------------------------

## 1.1 මතය

----------

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

-----------------------

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 63.4 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. බිලියන 55.6 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 7.8 ක වර්ධනයක් පිළිබිඹු විය. විදේශීය මූල්‍ය ආයෝජන ආදායම හා දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| | 2020 | 2019 | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | **56.3** | **76.9** | **(20.6)** | **( 26.7)** |
| පොලී ආදායම | 26.2 | 32.9 | (6.7) | (20.3) |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය) | 23.5 | 42.9 | (19.4) | (45.2) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ ලාභය /(අලාභය) | 6.5 | 1.1 | 5.4 | 490.9 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | **7.3** | **8.5** | **1.2** | **14.1** |
| පොලී වියදම | 5.3 | 8.3 | 3 | 36.1 |
| අපේක්ෂිත ණය අලාභ | 2.0 | 0.2 | (1.8) | (900.0) |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය)** | **7.1** | **(14.6)** | **21.7** | **148.6** |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ලද සමස්ථ ශුද්ධ ආදායම / (වියදම)** | **16.9** | **14.2** | **2.7** | **19.0** |
| **වෙනත් ආදායම්** | **1.6** | **1.5** | **0.1** | **6.7** |
| **මෙහෙයුම් වියදම්** | **11.2** | **13.6** | **2.4** | **17.6** |
| **බදු** | **-** | **0.3** | **0.3** | **100.0** |
| **වර්ෂය සඳහා ලාභය (අලාභය)** | **63.4** | **55.6** | **7.8** | **14.0** |

(අ) මුදල් නීති පනතේ 41 වන වගන්තියට අනුව, බැංකුවේ වාර්ෂික ලාභ හා අලාභ ගණනය කිරීමේදී, විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ හෝ අලාභ ඇතුළත් නොකළ යුතුය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ලාභය රු. බිලියන 56.3 ක් වූ අතර (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු. බිලියන 7.1 ක් හැර) ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ ලාභය රු. බිලියන 70.2 ක් වූයෙන් (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය රු. බිලියන 14.5 ක් හැර) ලාභයේ රු. බිලියන 13.9 ක පරිහානියක් පිළිබිඹු විය. විදේශීය මූල්‍ය වත්කම්වලින් ලද ආදායම රු. බිලියන 20.6 කින් අඩුවීම මෙම ලාභයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) මුදල් නීති පනතේ 38 සහ 41 වැනි වගන්ති හා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට (2018 වර්ෂයේ සිට බලාත්මක) අනුව තීරණය කරන ලද සමාලෝචිත වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභය රු.බිලියන 18.6 ක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභය රු.බිලියන 25.4 ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභයෙන් රු. බිලියන 15 ක් හෙවත් සියයට 80.6 ක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණු අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේදී රු. බිලියන 24 ක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | **මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන**<br>ආර්ථිකයේ වැඩෙන ඉල්ලුමට සරිලන පරිදි අභ්‍යන්තර හා බාහිර කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන ශක්තිමත් බැංකු / බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් 2014 ජනවාරි 17 වන දින මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා බැංකුව විසින් ප්‍රධාන සැළැස්ම එළිදැක්විණි. ඒ අනුව, 2021 මැයි 12 වැනි දිනට රු. මිලියන 105.58 ක් වැය කරමින් බැංකු, මුදල් සමාගම් හා කල්බදු සමාගම් ඇතුළත් ඒකාබද්ධ කිරීමේ සැළසුම් 12 ක් සම්පූර්ණකර තිබුණි.<br>කෙසේ වෙතත්, ආයතන 4 ක් සම්බන්ධයෙන් බැංකුව රු.මිලියන 21.44 ක් වැයකර තිබුණ ද, ඒවයේ ඒකාබද්ධ සැළසුම් 2021 මැයි 12 දිනටම් සම්පූර්ණ වී නොතිබුණි.<br>ඉහත වියදම්වලට අමතරව, ආයතන 19 ක් සම්බන්ධව තොරතුරු ලියවිල්ල, නිසි පරීක්ෂාව හා තක්සේරු වාර්තා පිළියෙල කිරීම සහ අනෙකුත් කාරණා සඳහා බැංකුව විසින් රු. මිලියන 59.25 ක අමතර මුදලක් වැය කර තිබුණු අතර ඒවා 2021.12.31 වන විට සම්පූර්ණ වී නොතිබුණි.<br>ඉහත ඒකාබද්ධ කිරීමේ සැළසුමට අතිරේකව 2020 වර්ෂයේදී "බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රධාන සැළැස්මක්" බැංකුව විසින් ආරම්භ කර තිබුණු අතර, 2021 අප්‍රේල් 30 වන විට තොරතුරු ලියවිල්ල, නිසි පරීක්ෂාව හා තක්සේරු වාර්තා පිළියෙල කිරීම සඳහා රු. මිලියන 21.68 ක මුදලක් වැය කර තිබුණි. | මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩසටහන යටතේ, සුදුසු ඒකාබද්ධ කිරීමේ හවුල්කරුවන් සොයාගැනීමේ අදහසින් යුක්තව සියලු බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධව නිසි පරික්ෂා සිදුකරන ලදි.<br>බැංකුව විසින් පත්කරන ලද මණ්ඩලයේ බාහිර විගණකවරුන් විසින් ලබාදෙන ලද ඒකාබද්ධ කිරීම හා පවරාගැනීමේ වෘත්තීය සේවාවන් සම්බන්ධ පිරිවැය දැරීම මඟින් බැංකුව ඒකාබද්ධ කිරීමේ වැඩසටහන සඳහා පහසුකම් සලසන ලදි.<br>බැංකු නොවන මූල්‍ය ආයතන 12 ක් ඒකාබද්ධ කිරීමේ ගනුදෙනු අවසන් කළ අතර ඒ වෙනුවෙන් බාහිර විගණකවරුන්ට නිසි පරීක්ෂා හා ගනුදෙනු ගාස්තු ලෙස රු. මිලියන 105.58 ක් බැංකුව දරන ලදි.<br>2015 දී රජය වෙනස්වීම හේතුවෙන්, ඒකාබද්ධ කිරීමේ වැඩසටහනට සම්බන්ධ ප්‍රතිපත්තිය ද සංශෝධනය කළ අතර බැංකු නොවන මූල්‍ය ආයතනවල කැමැත්ත මත කිරීමට (optional) ඉඩදෙන ලදි. මෙම තත්වය නිසා බැංකුවට ඒකාබද්ධ කිරීම් සහ අත්පත්කරගැනීම් බලගැන්වීම් කිරීමට නොහැකි විය. | ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය, කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| 2018 දී ආරම්භ කළ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඒකාබද්ධ කිරීමේ (merge) ක්‍රියාවලිය 2021.12.31 දිනවන වටත් සම්පූර්ණ වී නොතිබුණි.<br>තවද, ආම්භයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිතයක් ලෙස පවත්වාගෙනයාමට යෝජනා කර අවසන් වූ ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟම ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය (merge) ද 2021 දෙසැම්බර් 31 වන විට අවසන් වී නොතිබුණි. | පවරාගනු ලබන්නන් විසින් මූලික කොටස් (initial stakes) පවරාගෙන තිබුණ ද, ප්‍රතිපත්තිය වෙනස්වීම හේතුවෙන්, ගනුදෙනු හතරක් අවසන් කිරීමට නොහැකි විය.<br>තවද, අපේක්ෂිත ගැණුම්කරුවන් නොමැතිවීම හේතුවෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන 19 ක ඒකාබද්ධ කිරීම් අසාර්ථක විය. කෙසේ වෙතත්, මෙම බැංකු නොවන මූල්‍ය ආයතන 19 සම්බන්ධව බාහිර විගණකවරුන් හරහා නිසි පරීක්ෂා (තක්සේරු වාර්තා සහිතව) කිරීමට බැංකුව රු. මිලියන 59.25 ක් වැයකරන ලදි.<br>බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන වැඩසටහන - 2020 හි අදියර 1 යටතේ, ශක්තිමත් හා ස්ථාවර බැංකු නොවන මූල්‍ය ආයතන සමඟ ඒකාබද්ධ කිරීම සඳහා ඉලක්කගත ආයතන ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන 11 ක් ( ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සමඟ නියාමන අනුකූලනොවීම් පදනම මත) බැංකුව හඳුනාගෙන ඇත. | |

**ආ මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය**

| | | |
|---|---|---|
| 2020 අගෝස්තු 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ලබා දෙනු ලබන ණය කාඩ්පත් අත්තිකාරම් හා උකස් අත්තිකාරම් මත පොලී අනුපාත අඩුකිරීමට මුදල් මණ්ඩලය විසින් නියෝගයක් නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, ණය කාඩ්පත් අත්තිකාරම් හා උකස් අත්තිකාරම් ලබාදෙනු ලබන, 2011 අංක 42 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි මුදල් සමාගම්වලට විධානයක් නිකුත් කර නොතිබුණි. | බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පතු හා ණය උපකරණ මත උපරිම පොලී අනුපාත පනවන ලදි. ණය මත උපරිම පොලී අනුපාත නොපැනවීමට මෙය හේතු වූ අතර එය බලපත්‍රලාභී බැංකු මත පනවන ලදි. | අවශ්‍යතාවය සලකාබැලීම අවශ්‍ය වේ. |

**ඇ මුදල් සමාගම් ගණන් බේරා වසාදැමීම**

| | | |
|---|---|---|
| 2018, 2019 හා 2020 වර්ෂවලදී බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද | 2007 අංක 7 දරන සමාගම් පනතේ නවවැනි උපලේඛනයේ දක්වා ඇති | ක්‍රියාවලිය වේගවත් කිරීම අවශ්‍ය වේ. |

මුදල් සමාගම් හතරෙහි ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය (ඈවරකරුවකු පත්කරීම) 2021 අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. බලපත්‍රය අවලංගු කළ දින සිට වැඩකරන දින 30 ක් ඇතුළත ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2018 මාර්තු 05 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රය අවලංගු කරන ලද මුදල් සමාගමට නියෝගයක් කර ඇති අතර එම කාල සීමාව තුළ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට එම සමාගම අපොහොසත් වී තිබුණි.

එසේම, බලපත්‍රය අවලංගු කළ දින සිට වැඩකරන දින 30 ක් ඇතුළත ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2018 ජූලි 25 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රය අවලංගු කරන ලද තවත් මුදල් සමාගමකට නියෝග කර ඇති අතර එම කාල සීමාව තුළ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට එම සමාගම අපොහොසත් වී ඇත.

වරණීය හිමිකම්පෑම් බලපත්‍රලාභී මුදල් සමාගම්වල ගණන් බේරා වසා දැමීමේ අවශ්‍යතා ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන බව බැංකුවේ අදහස වේ. එබැවින්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 33 වගන්තිය ප්‍රකාරව, බලපත්‍රලාභී මුදල් සමාගම් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධ නව නියෝගයක් නිකුත් කිරීමට තීරණය කරන ලදි.

පසුව, මුදල් ඇමතිවරයා විසින් 2019 අංක 1 දරන මුදල් ව්‍යාපාර (මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් වන) නියෝග 2019 මාර්තු 31 දින ගැසට් කරන ලද අතර ඉන් පසුව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ප්‍රමාදයකින් තොරව බලපත්‍රලාභී මුදල් සමාගම් ගණන් බේරා වසා දැමීම සඳහා අයදුම්පත් ගොනුකිරීම ආරම්භ කර තිබුණි.

**ඈ ලීසිං සමාගම් නියාමනය හා අධීක්ෂණය**

2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතේ ඇතුළත් ප්‍රතිපාදන අනුව, මූල්‍ය කල්බදු යටතේ නියම කර ඇති පරිදි, බදු ගැණුම්කරු විසින් නියමිත මුදල් ගෙවා තිබුණද, නොතිබුණද උපකරණයේ සන්තකය, අයකර ගත් මුදල් සහ අයකර ගත් කිසියම් අලාභයක් වේනම් එයද යනාදි සියලු ප්‍රතිලාභ බදු දීමනාකරුට හිමි වේ. එමෙන්ම මූල්‍ය කල්බදු යටතේ වන සමස්ත වගකීම්වලට බදු ගැණුම්කරු යටත් වේ. එබැවින්, පනතේ කිසියම් සංශෝධනයක් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා පනත සමාලෝචනය කිරීම අවශ්‍ය විය හැකිය. 2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ප්‍රතිචාර වශයෙන්, වර්තමාන වෙළඳපල තත්වයන් හා ජාත්‍යන්තර හොඳ පරිචයන්වලට අනුකූලව අදාල පනත්වලට සංශෝධනයන් බැංකුව විසින් පරික්ෂා කරමින් සිටින බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, 2021 වර්ෂය අවසන් වන විටත් එවැනි සංශෝධන කර නොතිබුණි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මූල්‍ය කල්බදු පනතට සංශෝධන කෙටුම්පත් කිරීම සඳහා තාක්ෂණික හා මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර ඇති අතර උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත. සංගම් දෙකකින් යෝජනා ලැබුණු අතර බැංකුව ප්‍රතිපාදන පරීක්ෂා කරන අතර අවශ්‍යවන්නේ නම් සංශෝධනයන් කරනු ලැබේ.

අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.

| | | | |
|---|---|---|---|
| ඉ | **ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය** | | |
| | ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව, මෙම පනත බලපැවැත්වෙන දින සිට 2021 ජූනි 30 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යාම සඳහා සමාගම් හතරක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි.<br>2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ප්‍රතිචාර වශයෙන්, ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ණය නියාමන අධිකාරියක් වෙනම පනතක් හරහා ස්ථාපිත කරන බවත් එම යෝජිත පනතෙහි කෙටුම්පත 2019 නොවැම්බර් 26 දින මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, 2021 වර්ෂය අවසාන වන විටත් එය බලාත්මක කර නොතිබුණි. | ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත (යෝජිත පනත) නම් වූ පාර්ලිමේන්තු පනතක් මඟින් ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරියක් පිහිටුවීමට යෝජනා කර ඇත. බැංකුව මුදල් අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක සමඟ කෙටුම්පත් පනත අවසන් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටියි. යෝජිත පනත 2022 වර්ෂයේදී බලාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. | පනත බලාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |
| ඊ | **රාජ්‍ය ණය කළමනාකරණය** | | |
| i | මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රාජ්‍ය ණය කළමනාකරණය හා සම්බන්ධ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ණය යන්නට අතුළත් වන්නා වූ ණය වර්ගයන් හෙවත් රාජ්‍ය ණය සඳහා නිර්වචනයක්, රාජ්‍ය ණය කළමනාකරණයේ අරමුණු සහ කාර්යයන් පිළිබඳව මුදල් නීති | මුදල් නීති පනතේ 113 වගන්තිය අනුව බැංකුව රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් නියෝජිත කාර්යයක් කිරීම අවශ්‍ය වේ. බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණයේ කාර්යයන් හා අරමුණු සම්බන්ධව මුදල් නීති | රාජ්‍ය ණය යන්නට අතුළත් වන්නා වූ ණය වර්ගයන්, රාජ්‍ය ණය සඳහා නිර්වචනයක්, රාජ්‍ය ණය කළමනාකරණයේ |

| | | | |
|---|---|---|---|
| | පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක සඳහන් වී නොමැත. | පනතේ ප්‍රමාණවත්ව පැහැදිලි කර නොමැති බව හඳුනාගෙන ඇත. ණය කළමනාකරණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇතැම් නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් බැංකුව හා භාණ්ඩාගාරය සමඟ සාකාච්ඡා කර ජාත්‍යන්තර නියෝජිත ආයතනයක තාක්ෂණික සහයෝගයෙන් තනි ණය කළමනාකරණය කාර්යාලයක් පිහිටුවීමේ උත්සාහයක් වසර කිහිපයකට ඉහතදී ආරම්භ කළ ද එය ඉදිරියට නොයන ලදි. බැංකුව වෙත පවරා ඇති ණය කළමනාකරණයේ අරමුණු සහ කාර්යයන් සම්බන්ධව තවදුරටත් පැහැදිලිබවක් ඇතිකිරීම සඳහා අලුත් සංවාදයක් අදාල පාර්ශවයන් අතර ආරම්භකළ හැකිය. | අරමුණු සහ කාර්යයන් නිර්වචනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| ii | රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම් සම්බන්ධ ණය තොරතුරු සහ රජය වෙනුවෙන් අදාළ පර්ශවයන් විසින් ලබා ගන්නා අනෙකුත් ණය පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු මඟින් ලබා ගන්නා ණය තොරතුරු යොදා ගනිමින් බැංකුව විසින් නොපිය වූ මධ්‍යම රජයේ ණය වාර්තා කරනු ලබයි. කෙසේ වෙතත්, බැංකුව විසින් බැංකු අයිරා ශේෂයන්හි සහ නොපිය වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හැර අනෙකුත් නොපිය වූ විදේශ ණයවල නිර්වද්‍යතාවය තහවුරු කර ගන්නා බව නිරීක්ෂණය නොවීය. | බැංකුව රාජ්‍ය ණය පිළිබඳ තොරතුරු ඍජුවම ස්වකීය මූලාශ්‍රයන්ගෙන් සහ ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් සම්පාදනය කරයි. බැංකුව ප්‍රාථමික මූලාශ්‍රය වන ණයවල සියලු විස්තර සම්පාදනය කර කඩිනමින් අදාල පාර්ශවයන් සමඟ හුවමාරු කර ගනියි. මුදල් අමාත්‍යාංශය ප්‍රාථමික මූලාශ්‍රය වන හා කාලානුරූපීව මහබැංකුවට වාර්තාකරනු ලබන රාජ්‍ය ණය සංරචක කිහිපයක් ඇත. බැංකුවට දත්ත වාර්තා කරනු ලබන අනිකුත් ආයතන එම දත්ත නිවැරදිව වාර්තාකරනු ඇතැයි අපේක්ෂා කරන අතර මහ බැංකුව විසින් එම දත්ත සත්‍යාපනය කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. | බැංකු අයිරා ශේෂයන්හි සහ නොපිය වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හැර අනෙකුත් නොපිය වූ විදේශ ණයවල නිර්වද්‍යතාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | | |
|---|---|---|---|
| iii | 2017 ජූලි 24 දිනැති භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුව සම්බන්ධ විධානය ප්‍රකාරව, බැඳුම්කර වෙන්දේසියේ තෙවන අදියර (පළවන අදියර යටතේ තීරණය වූ හරිත සාමාන්‍ය ඵලදා අනුපාතය යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් වෙත බැඳුම්කර අනිවාර්ය පදනම යටතේ වෙන්කිරීම) ක්‍රියාත්මක වීම සඳහා පිරිනමන ලද වටිනාකමෙන් සියයට 60 ක් පළමු අදියර යටතේ පිළිගෙන තිබිය යුතුය. මෙය 2019 ජූලි 09 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 70 ක් ලෙස සංශෝධනය කර තිබුණු අතර 2021 සැප්තැම්බර් 23 සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 80 දක්වා තවදුරටත් ඉහළ දැමීමටත් තුන්වන අදියර, ඉතිරි පරිණත කාලය වසර 5 ක් හෝ ඊට අඩු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පමණක් ක්‍රියාත්මකවන ලෙස සීමා කිරීමත් රාජ්‍ය ණය අධිකාරි විසින් කරන ලදි. සියයට 60 සීමාව සියයට 80 දක්වා වැඩි කිරීමෙන් විචක්ෂණශීලී අවදානම් මට්ටමකට හා අනුරූපව අවම පිරිවැයක් යටතේ රජය වෙත මුදල් රැස්කිරීම තවදුරටත් සීමා වීමට හේතු වන බව නිරීක්ෂණය විය. | අවම පිළිගැනීමේ මට්ටම සියයට 70 සිට සියයට 80 දක්වා ඉහළ නැංවීමට හා ඉතිරි පරිණත කාලය වසර 5 ක් හෝ ඊට අඩු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා තෙවන අදියර ක්‍රියාත්මකවීම සීමා කිරීමටත් මුදල් මණ්ඩලය විසින් 2021.07.20 වැනි දින පැවති එහි රැස්වීමේදී අනුමත කරන ලදී. පළවන අදියර යටතේ වෙළඳපල නිෂ්කාශිත මිලක් / ඵලදා අනුපාතයක් ස්ථාපිත කිරීම තවදුරටත් ඉහළ නැංවීම සහ තෙවන අදියර සක්‍රිය කිරීම පිළිබඳව වෙළඳපොළ සහභාගිවන්නන්ගේ ප්‍රතිචාර සලකා බලමින් මෙම වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කරන ලදි. | විචක්ෂණශීලී අවදානම් මට්ටමකට සහ අනුරූපව අවම පිරිවැයක් යටතේ රජයට මුදල් රැස් කිරීමට සියළුම උත්සාහයන් ගැනීම. |
| iv | රජයේ සුරැකුම්පත් ගනුදෙනු වලදී අරමුදල් නිරවුල් කිරීම, නිර්ලේඛන සුරැකුම්පත් පියවීම සහ රජයේ සුරැකුම්පත්වල අයිතිය පිළිබඳ වාර්තා කිරීම සඳහා පහසුකම් සපයනු ලබන ලංකාසෙට්ල් පද්ධතියේ පවතින, විගණනයේදී නිරීක්ෂණය වූ සීමාකම් පහත සඳහන් වේ. | | |
| | • CRP සුරැකුම්පත් ගිණුමේ වාර්තා කරනු ලබන සුරැකුම්පත් මත බැංකුව විසින් ගෙවනු ලබන කූපන් මුදල් සහ කල්පිරෙන මුදල් වල ප්‍රතිලාභියා හඳුනාගැනීමට අපහසු වීම. | දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතේ 9 හා 10 වගන්තිවල 3 වන උපවගන්තිය සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ 21ඩී හා 21ඊ වගන්තිවල 3 වන උපවගන්තිය ප්‍රකාරව, නිර්ලේඛන රජයේ සුරැකුම්පත්වල මූලික වටිනාකම, පොලිය හා නිදහස්කිරීමේ වටිනාකම ලෙස ගෙවිය යුතු මුදල සෘජු සහභාගිකරුවන්ට හෝ අළෙවිකාර සෘජු සහභාගිකරුවන්ට ගෙවිය යුතුය. එවැනි ගෙවීම් අළෙවිකාර සෘජු සහභාගිකරුවන් විසින් පාරිභෝගිකයන්ගේ අදාල ගිණුම්වලට බැර කරනු ලැබේ. | මෙය කිරීමේ හැකියාව පිළිබඳව සලකාබැලීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | • ලංකාසෙකියු පද්ධතිය තුළ ප්‍රාථමික අලෙවිකරු සහ ඔවුන්ගේ ගනුදෙනුකරු අතර සිදු කරනු ලබන ප්‍රතිමිලදීගැනීමේ / ප්‍රතිවිකුණුම් ගනුදෙනුවලදී අපේක්ෂිත මුදල, ආපසු ගෙවන දිනය සහ ආපසු ගෙවන මිල වැනි අදාළ තොරතුරු වාර්තා නොකිරීම. | රජයේ සුරැකුම්පත් වෙළඳපලේ (ද්විතීයික වෙළඳපල) කරනු ලබන ගනුදෙනුවල වැඩි ගුණාංග ඇතුළත්කර ගැනීමට හා විනිවිදභාවය වැඩිකිරීම සඳහා 2020 ජනවාරි 1 දින සිට (2019 ඔක්තෝබර් 1 දින නිකුත් කළ චක්‍රලේඛනය) නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය තුළ පියවීම් වටිනාකම, මිල හා අදාල ගනුදෙනුවල පොලී අනුපාතය වැනි තොරතුරු සහභාගිකරුවන් විසින් වාර්තා කිරීම අවශ්‍ය වේ.<br>2021 අප්‍රේල් 1 සිට ක්‍රියාත්මක වන පරිදි සහභාගිකරුවන්, ද්විතීයික වෙළඳපලේ රජයේ සුරැකුම්පත් ගනුදෙනු මහබැංකුවට වාර්තා කිරීම අවශ්‍ය වේ. (2021 මාර්තු 26 නිකුත් කළ චක්‍රලේඛනය). 2023 වන විට සජීවිව යනු ඇතැයි අපේක්ෂා කරනු ලබන ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම අවශ්‍යතා තවදුරටත් ශක්තිමත් වනු ඇත. | වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදුකිරීම අවශ්‍ය වේ. |
| | • ප්‍රතිමිලදීගැනීමේ ගනුදෙනු සඳහා වෙන්කර ඇති සුරැකුම්පත් වෙනුවට වෙනත් සුරැකුම්පතක් ආදේශ කිරීමෙන් තොරව එම සුරැකුම්පත් ඉවත් කිරීමට නොහැකි වන අයුරින් ලංකාසෙකියු පද්ධතියෙහි කිසිදු සීමාකිරීමක් නොමැති වීම. | ලංකාසෙකියු පද්ධතියෙහි සුරැකුම්පත් වෙන්කිරීම සඳහා සීමාකිරීම් පැනවීම තාක්ෂණිකව ශක්‍ය නොවේ. කෙසේ වෙතත්, බැංකුව විසින් කරනු ලබන අධීක්ෂණ කාර්යභාරයේ කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු සම්බන්ධ සුරැකුම්පත්වල චලනයන් පරීක්ෂා කරනු ලැබේ. තවද, ආදේශ කිරීමකින් තොරව ගනුදෙනුකරුගේ ගිණුම්වලින් වෙන්කරන ලද සුරැකුම්පත් ඉවත් කිරීම වැනි අලෙවිකාර සෘජු සහභාගිකරුවන්ගේ ඕනෑම අනවසර ක්‍රියාවක් බැංකුව විසින් ගනුලබන නියාමන ක්‍රියාමාර්ගවලට තුඩුදෙනු ඇත. | ආයෝජකයන් ආරක්ෂාකිරීමට සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| v | ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් සඳහා බැංකුව විසින් නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති නීති අනුවාදය 2.1 (2013) හි වගන්ති අංක 2.2 අනුව, ප්‍රාථමික අලෙවිකරුවෙකු | පනතක් හරහා සෘජුවම එවැනි දඩ මුදල් පැනවීමට පැහැදිලි බලයක් නොමැති අවස්ථාවක දී, යටත් නීති (පනත් මත පදනම්ව නිකුත් කරනු | ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | අනුගමනය කළ යුතු නීති හා රෙගුලාසි උල්ලංඝනය කරන විටදී එම ප්‍රාථමික අලෙවිකරුට එරෙහිව දඩ මුදල් නියම කළ හැකිය. තවද, 2019 දෙසැම්බර් 20 දිනැති 2019 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත් සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත් විධානයේ 8 වන වගන්තියට අනුව (ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු), එම විධානයට අනුකූල නොවීම සම්බන්ධයෙන් අළෙවිකාර ඍජු සහභාගිකරුවන්ට එරෙහිව දඩ මුදල් නියම කළ හැකිය.<br>කෙසේ වෙතත්, බැංකුවට මෙම විධිවිධාන බලාත්මක කිරීමට නොහැකිවීමෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ට හෝ අළෙවිකාර ඍජු සහභාගිකරුවන්ට එරෙහිව දඩ මුදල් පනවා නොතිබුණි. | ලබන නියෝග හා විධානයන්) මඟින් දඩ මුදල් පැනවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව බැංකුවේ නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇත. මේ සම්බන්ධයෙන්, බැංකුව විසින් මෙම කාරණය විසඳීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව සලකා බලනු ඇත. | |
| vi | ගනුදෙනුකරුගේ යහපතට එරෙහිව කටයුතු කරන ප්‍රාථමික අලෙවිකරුවන්ට දඩ මුදල් පැනවීමට සුදුසු රාමුවක් සකස් කිරීම සඳහා 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් මණ්ඩලය විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2020 වර්ෂය අවසන් වන විටත් එවැනි සුදුසු රාමුවක් සකස් කර නොතිබුණි. | රජයේ සුරැක්ම්පත් වෙළඳපලේ දඩ මුදල් සම්බන්ධ ප්‍රතිපාදනවල වර්තමාන නියාමන රාමුව ශක්තිමත් කිරීමට, අළෙවිකාර ඍජු සහභාගිකරුවන්ගේ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සම්බන්ධව ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ 2019 අංක 1 දරන විධානය 2019.12.20 දින නිකුත් කරන ලදි. කෙසේ වෙතත්, නෛතික වශයෙන් දඩ මුදල් සම්බන්ධ ප්‍රතිපාදන වඩාත් බලාත්මක කිරීම සඳහා ඒවා ඇතුළත් කිරීමට අදාල පනත් සංශෝධනය කිරීම අවශ්‍ය වේ. බැංකුව දැනටමත් අදාල කාරණය විසඳීමට ප්‍රවේශ කිහිපයක් සලකා බලමින් සිටියි. | ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |
| vii | 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය ප්‍රකාරව, මෙම ආඥා පනත යටතේ ලබා ගත යුතු එක් එක් ණය (භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම) සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් බලය ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2018, 2019 සහ 2020 | ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතට අදාළ සංශෝධන මුදල් අමාත්‍යාංශයට යෝජනා කර ඇත.<br>මුදල් ඇමතිවරයාගේ අත්සන සඳහා 2018 හා 2019 වර්ෂවල නියෝග පත්‍ර (Order Papers) සහ ලේඛන මුදල් අමාත්‍යාංශයට යොමු කර ඇති | ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | යන වර්ෂ සඳහා එවැනි නියෝගයක් 2020 දෙසැම්බර් මාසය අවසානය වන විටත් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. තවද, ආඥා පනතේ 4 වන වගන්තියට පටහැනිව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ සත්‍ය ප්‍රතිඵල මත පදනම්ව, 2008 සිට 2017 දක්වා වූ වර්ෂ සඳහා වන නියෝග අදාළ වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේදී ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර තිබුණි. | අතර 2018 හා 2019 වර්ෂවල භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා බැංකුව නිසිපරිදි අත්සන් කළ නියෝග පත්‍ර අපේක්ෂාවෙන් සිටියි.<br>2020 වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන ගැසට්පත්‍ර, අදාල මුදල් ඇමතිවරයාගේ නියෝග සමඟ 2021 වර්ෂයේදී ලැබෙනු ඇත. | |
| උ | **අභ්‍යන්තර අරමුදල් හසුරුවන බැංකුවේ දෙපාර්තමේන්තු විසින් කරන ලද ආයෝජනයන්**<br>නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුවකු සමඟ ආරක්ෂණයන් නොමැති ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල ආයෝජනයන් හේතුවෙන් බැංකුවේ දෙපාර්තමේන්තු හතරක් විසින් කළමනාකරණය කරන අරමුදල්වලට 2018.12.10 දිනට රු. මිලියන 2,586 ක අලාභයක් සිදුවිය. 2020 සැප්තැම්බර් 18 දිනට එම ප්‍රාථමික අළෙවිකරුගෙන් ලැබිය යුතු ලෙස නැවතවර්ගීකරණය කරන ලද ආයෝජනයේ වටිනාකම රු. මිලියන 2,953.6 ක් විය. | නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට බැංකුව දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.<br>2016 වර්ෂයේ මුල්භාගයේ සිට ඉදිරියට, අභ්‍යන්තර ආයෝජන අරමුදල් ආයෝජනය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට බැංකුවේ ආයෝජන දෙපාර්තමේන්තු පියවර ගෙන ඇත. | අලාභය අයකර ගැනීම අවශ්‍ය වේ. |